# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2287/28 - 2022 ජූලි මස 07 වැනි බ්‍රහස්පතින්දා - 2022.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 24/51(XII)

**(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනත**

(203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 158 වන වගන්තියේ (2) වන සහ (3) වන උපවගන්ති සමග කියවිය යුතු ඒ පනතේ 237 වන වගන්තිය යටතේ ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය.

2022 ජූලි මස 05 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2022 අංක 02 දරන මෝටර් වාහන (ආරක්ෂක හිස්වැසුම්) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. යතුරු පැදියක් පදවන හෝ යතුරු පැදියක රැගෙන යන සෑම තැනැත්තකු ම, මුහුණු ආවරණයක් සහිත හෝ රහිත ආරක්ෂක හිස්වැසුමක් පැළඳිය යුතු අතර, එම ආරක්ෂක හිස්වැසුම -

(අ) කබොළකින්, කම්පන අවශෝෂක ස්ථරයකින්, නිකට පටියකින්, මෘදු ආරක්ෂිත ස්ථරයකින් සහ හිස වටා සවිකළ හැකි පටියකින් සමන්විත විය යුතු ය;

(ආ) වාහන පාවිච්චි කරන්නන් සඳහා ආරක්ෂිත හිස්වැසුම් පිළිබඳ විශේෂ විස්තරයට අදාළ, බී මාදිලිය ලෙස වර්ගීකරණය කරන ලද හිස්වැසුම්වලට (ශ්‍රී ලංකා ප්‍රමිති 517:1994) හෝ ආරක්ෂක හිස්වැසුම් සම්බන්ධයෙන් කලින් කල අදාළ වන්නා වූ ප්‍රමිතීන්ට අනුකූල විය යුතු ය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති නිෂ්පාදන සහතික සළකුණ එම ආරක්ෂිත හිස්වැසුම දැරිය යුතු ය;

(ඇ) එහි බාහිර මතුපිටින් කිසිදු ආලෝක පරාවර්තනයක් සිදු නොවිය යුතු ය.



මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

3. ආරක්ෂක හිස්වැසුමේ නිකට පටිය හිස්වැසුමට සුරක්ෂිතව සවිකර තිබිය යුතු අතර, හිස්වැසුම පළඳින තැනැත්තාට නිකට පටියේ දිග පහසුවෙන් සීරු මාරු කිරීමට හැකියාව ලබා දෙන සහ නිකට පටිය ආරක්ෂිතව සහ පහසුවෙන් සවි කිරීමට සහ ගැලවීමට හැකියාව ලබා දෙන යාන්ත්‍රණයකින් එය සමන්විත විය යුතු ය.

4. ආරක්ෂක හිස්වැසුමක් මුහුණු ආවරණයක් සහිතව වන අවස්ථාවක දී, එම මුහුණු ආවරණය -

(අ) ආරක්ෂක හිස්වැසුමට සවිකර තිබිය යුතුය; සහ

(ආ) (i) අඳුරු කරන ලද හෝ වර්ණ ගන්වන ලද ද්‍රව්‍යයකින් නිපදවා ඇත්නම්; හෝ

(ii) හිස්වැසුම පළඳින තැනැත්තාගේ බාහිර පර්යන්ත දැක්මට බාධාවක් වන්නේ නම්,

එය නොපැළඳිය යුතු ය.

5. ආරක්ෂක හිස්වැසුමක නිකට ආරක්ෂණයක් තිබිය හැකි අතර එවැනි නිකට ආරක්ෂණයක් මෙහි උපලේඛනයේ දක්වා ඇති පරිදි හිස්වැසුම පළඳින තැනැත්තාගේ බාහිර පර්යන්ත දැක්මට බාධාවක් නොවිය යුතු ය.

6. යම් තැනැත්තකු විසින් -

(අ) යතුරු පැදියක් පැදවීමේ කාර්යය සඳහා මේ නියෝගවල විධිවිධානවලට අනුකූල නොවන යම් හිස්වැසුමක් භාවිතා කිරීම හෝ විකිණීම හෝ විකිණීම සඳහා අර්පණය කිරීම නොකළ යුතු ය; සහ

(ආ) මේ නියෝගවල විධිවිධානයන්හි දක්වා ඇති ආරක්ෂිත හිස්වැසුමක් යම් පොදු ස්ථානයක දී හෝ පොදු රැස්වීමක දී නොපැළඳිය යුතු ය.

7. මේ නියෝග -

(අ) අපරාධ මැඬ පැවැත්වීමෙහිලා සේවයේ යොදවන ලද පොලිස් නිලධරයකු වෙත;

(ආ) ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීමේ කාර්යය පැවරී ඇති ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ, ශ්‍රී ලංකා නාවික හමුදාවේ හෝ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සාමාජිකයකු වෙත;

(ඇ) අවදානම් සහිත කාර්යවල සේවයේ යොදවන ලද තැනැත්තකු වෙත; හෝ

(ඈ) යම් මාර්ගයක යතුරුපැදි ධාවන තරගයක යතුරුපැදියක් පැදවීමට හෝ එවැනි තරගයක් සඳහා පෙර පුහුණුවීම් කිරීමට අදහස් කරන තැනැත්තකු වෙත,

ඒ වගකීම් හෝ කාර්ය සිදුකරන අවස්ථාවේ දී අදාළ නොවිය යුතු ය. -

8. 1991 ජනවාරි මස 11 වැනි දින අංක 644/26 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 1990 මෝටර් වාහන (අනුමත කරන ලද ආරක්ෂක හිස්වැසුම්) නියෝග හා 2017 පෙබරවාරි මස 23 වැනි දින අංක 2007/39 දරන *අතිවිශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද 2017 අංක 02 දරන මෝටර් වාහන (ආරක්ෂක හිස්වැසුම්) නියෝග ඒ යටතේ මින් පෙර සිදු කරන ලද කිසිවකට අගති රහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

9. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගවල -

"නිකට ආරක්ෂණය" යන්නෙන්, මුහුණේ පහත කොටස ආවරණය වන, ආරක්ෂක හිස්වැසුමේ කබොළෙහි දිගුවක් හෝ සම්බන්ධිතයක් අදහස් වේ;

"නිකට පටිය" යන්නෙන්, පළඳින තැනැත්තාගේ හිස ගැටීමක දී හිස්වැසුම හිසෙහි රඳවා තැබීම අපේක්ෂා කෙරෙන, මී. මී. 20කට වඩා පළලින් අඩු නොවන, පළඳින තැනැත්තාගේ නිකට යටින් හෝ යටි හනුවට යටින් ගමන් කරන පටියක් අදහස් වේ;


"බාහිර පර්යන්ත දැක්ම" යන්නට, වාහන පාවිච්චි කරන්නන් සඳහා ආරක්ෂිත හිස්වැසුම් පිළිබඳ විශේෂ විස්තරය (ශ්‍රී ලංකා ප්‍රමිති 517:1994) හි සඳහන් අර්ථය ම ඇති අතර මෙහි උපලේඛනයට අනුකූල විය යුතු ය;

"මාර්ගය" යන්නට, (203 වන අධිකාරය වූ) මෝටර් වාහන පනතෙහි සඳහන් අර්ථයම ඇත්තේ ය; සහ


"මුහුණු ආවරණය" යන්නෙන්, පළඳින තැනැත්තාගේ ඇස්වලට ඉහළින් ඉදිරියෙන් විහිදෙන්නා වූ සහ මුළු මුහුණම හෝ මුහුණෙහි කොටසක් ආවරණය වන්නා වූ විනිවිද පෙනෙන ආරක්ෂක මුවාවක් අදහස් වේ.

## උපලේඛනය

(5 වන නියෝගය)




1 වන ආකෘතිය : බාහිර පර්යන්ත දැක්මේ ප්‍රදේශ - පැති පෙනුම




2 වන ආකෘතිය : බාහිර පර්යන්ත දැක්මේ ප්‍රදේශ - ඉහළින් පෙනුම

*සටහන* : 1. ආකෘති 1 සහ 2 හි පෙන්වා ඇති පරිදි $7^0$, $45^0$, සහ $105^0$ දර්ශක කෝණ තිබිය යුතු ය.

2. අන්වායාම සිරස් තලයෙහි හිසෙහි ආකෘතියේ ඉදිරි මතුපිට මත එල්කේ රේඛාව පිහිටයි. අන්වායාම සිරස් තලයේ දෙපසට මිලි මීටර් 31කින් හිසෙහි ආකෘතියේ මතුපිට කේ 1 සහ කේ 2 ලක්ෂ්‍යයන් පිහිටයි.

3. එල් 1 සහ එල් 2 ලක්ෂ්‍යයන් මගින් පිළිවෙලින් වම් සහ දකුණු ඇස් නිරූපණය වේ.

EOG 07-0034

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.